# ලංකාවිත්ති
# LANKA VITHTHI

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුම්ය!
Mother and Motherland are nobler than Heaven



FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි
VOLUME 13
NUMBER 11

ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

FEBRUARY 10, 2011 පෙබරවාරි මාසය (බුද්ධ වර්ෂ 2554 නවම් මාසය) http://www.lankaheritage.com/lankaviththi/




රොෂාන් රණවන සහ පූජා උමාශංකර් Roshan Ranawana & Pooja Umashankar

# එක තැන පල්වීම !

♦ සංජය විමලරත්න ශ්‍රීලංකාවේ සිට

පසු ගිය සති කීපය මුළුල්ලේම ශ්‍රීලංකාව පුරා මාදුටු දැවෙන ප්‍රශ්නය වනාහි ඉසිලිය නොහැකි අධිකතර ජීවන වියදමයි. ඒ මදිවාට මුළු රට පුරා ඇද හැළුණු නොනව තින ධාරාණිපාත වර්ෂාවද නිසා දිවයිනේ බොහෝ පළාත් වලට දැඩි අලාභ හානි සිදුවීම තුළින් ඒ ප්‍රශ්නය වඩාත් උග්‍ර විය. මෙය තනිකරම ගහෙන් වැටුණු මිනිහාට ගොනා ඇනීම හා සමානය.

කූට වෙළඳ මාෆියාවට පාඩමක් උගැන්වීමට ලොරි වලින් නගරයට පොල් ගෙනැවිත් දින කීපයක් අඩුවට පාරිභෝගිකයාට දීමත්, හමුදාව යොදා තැන් තැන්වල එළවළු අලෙවිකරීමත් යන ජනතාවට තරමක් සතුට ගෙනා ට්‍රික් වැඩ දෙක තුනක් හැරෙන්නට, අහස උසට යන ජීවන වියදම බස්සන්නට හෝ වෙළෙන්දන් විසින් ජනතාව ගසාකනු ලැබීම වළක්වන්නට හෝ රජය ගත් කිසිම ක්‍රමවත් වැඩ පිළිවෙලක් නැත. මැති ඇමතිවරුන්ට නම් කෑම බීම ගැන ප්‍රශ්නයක් නැත්තේ ඔවුන් ලබන විශාල වැටුපෙන් ඔවුන්ට ජීවන වියදම ඔරොත්තු දෙන බැවිනි.

## අනම් මනම් වැඩ

ජනතාව මෙතෙක් සියළු දුක් ගැහැට ඉවසාගෙන සිටි බව අපි හොඳින් දනිමු. යුද්ධය කාලයේ ඔවුන් බඩු මිළ, ආහාර මිළ වැඩිවීම් ගැන කටක් ඇරියේම නැත. එහෙත් දැන් යුද්ධය හමාරවූ පසුවත් ජීවන වියදම තවත් රොකට් වේගයෙන් ඉහළ යන්නේ නම් ඔවුන්ට නිසොල්මන්ව සිටිය හැකිද? දැන් දැන්, රජයට මෙතෙක් සහ තවමත් පක්ෂව සිටින ජනතාව පවා කෙඳිරිලි හඬ නගන්නට, අපවාද කියන්නට පටන් ගෙන ඇත. රජය නිදහසට කුමක් කීවත් මැති ඇමතිවරු මේ දැවෙන ප්‍රශ්නයන් ගැන කිසිදු පියවරක් ගන්නේ නැතිව වෙනත් අනම් මනම් කරමින් කාලය කන බව ජනතාවට හොඳින් පෙනේ. වැටහේ.

## වෙළඳ මාෆියාවට බියෙන්

කේරළයෙන් පොල් ගෙන්වනවායයි කී සැනින් හා ඉන්දියාවෙන් බිත්තර, කුකුල් මස් ගෙන්වනවා යයි කිව් සැනින් කූට වෙළෙන්දෝ තමන් ඉහළ දැමූ මිළ ගණන් වහා පහත හෙලූහ. මේ බඩුමිළ ඉහළ යෑම් අනෙක් ස්වාභාවික හේතුන්ට වඩා කළුකඩ වෙළෙන්දන්ගේ ගසාකෑමිය. රජය ඔවුන් මෙල්ල නොකොට ඔවුන් හමුවේ අකර්මණ්‍ය වී සිටින්නේ මේ වෙළඳ මාෆියාවට බියෙන් බව දැන් පැහැදිලිව වැටහේ.

## පුහු මාධ්‍ය ප්‍රචාරය

සති දෙකකට පෙර ජනාධිපතිවරයා ජීවන වියදම පහත හෙළීමට පියවර ගැන්ම සඳහා කැබිනට් ඇමතිවරුන්ද, මිළ පාලනය හා සම්බන්ධ වෙනත් නිලධාරීන්ද කැඳවා කළ විශේෂ රැස්වීමක් ගැන රූපවාහිනියෙන් හා අනෙක් මාධ්‍යවලින් විශාල ප්‍රචාරයක් දුන් නමුත් ඉන් පසු සිදුවූයේ කුමක් දැයි කිසිම ආරංචි මාත්‍රයක් නැත. ශ්‍රීලංකාව නමැති මේ රටේ ඇමතිවරු අනූවකට අඩු වැඩි ගණනක් විවිධ කාර්යයන් බාරව සිටින නමුත් ඒ හැමෝටම වැඩකට අත ගහන්නේ ජනාධිපතිවරයා කිව්වොත් පමණකි. එහෙත් ඒ කරන වැඩය අත ගහනවා පමණකි සම්පූර්ණ කරන බවක් කිසි විටක අප නම් දැක නැත.

මේ ගැන විමසිල්ලෙන් බලන කෙනෙකුට දේශපාලකයින් පිළිබඳ කවදත් පිළිගත් සාමාන්‍ය කියමනක් නිසැකවම සිතට නැගේ. එනම් මේ හාදයෝද දේශපාලන විමට බැස්සේ රටට ජනතාවට වැඩක් කරන්නට නොව තමා ආ කාර්යය සඳහාය. එනම් හැකිතාක් කල් බලයේ ඉන්නටද යන දාට තමාට පමණක් නොව තම හත්මුතු පරම්පරාවටම යමක් හම්බකරගෙන අයින් වෙන්නටය.

## රටට විනාශය ගෙනා අයහපත් කාලගුණය

දැන් මේ කඩාගෙන වැටුනු අවාසනාවන්ත තත්වය - එනම් නොනවතින වැස්ස, ජලගැල්ම හා නායයෑම් ආදිය ගැන සිතන විට මේ තත්වය තවත් දුර පැවතුණ හොත් ඉදිරි මාස වල කුමන ව්‍යසනයක් රටට කරකැවී එත්දැයි සිතීමත් බියජනක ය. දැනටම ජලගැල්මෙන් සිදුව ඇති හානිය රුපියල් බිලියන 50 ක් ඉක්මවා ඇතිබව බව ගණන් බලා තිබේ.

4 වන පිටුව බලන්න ➝

" ශ්‍රීලංකාව නමැති මේ රටේ ඇමතිවරු අනූවකට අඩු වැඩි ගණනක් විවිධ කාර්යයන් බාරව සිටින නමුත් ඒ හැමෝම වැඩකට අත ගහන්නේ ජනාධිපතිවරයා කිව්වොත් පමණකි. එහෙත් ඒ බාරගන්නා වැඩය අත ගහනවා පමණකි. සම්පූර්ණ කරන බවක් කිසි විටක අප නම් දැක නැත. "

තුරු හිස මල්ය හිනැහෙන සුවඳින් පිරුණු
නුබ පැහැදුල්ය දිසි තරු එළියෙන් තුරුණු
සිත කලබලව සමනල් ඉගිලෙනු පෙනුණු
සිහිනෙකි සුසමකින් මගදී ඇහැ ඇරුණු

Sweet-smelling flowers smile on tree-tops
Lambent stars adorn the vast evening sky
Some disturbed butterflies begin to fly
Oh! The dream stops half way with a sigh

♦ *දයා ආනන්ද රණසිංහ* ♦ *Daya Ananda Ranasinghe*


